# සුභාෂිතයෙන්.......

| | |
|---|---|
| අමිත ගුන නුවන යුතු උතුමෝ | පබඳ |
| අනත වෙහෙස ලදුවත් නොම වෙති | දුහද |
| දිගත පතල සුවඳති සොඳ සඳුන් | කඳ |
| සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි | සුවඳ |

**පද පිලිවෙල ගැදි පැදියකින් :**

අමිත ගුන නුවන යුතු
පබඳ උතුමෝ
අනත වෙහෙස ලදුවත්
දුහද නො ම වෙති
දිගත පතල
සුවඳ ඇති
සොඳ සඳුන් කඳ
සිඳිත
මඬිත
එක ලෙස සුවඳ පැතිරෙයි

**අදහස :**

අප්‍රමාන වු ගුනයෙන් හා නුවනින් යුක්ත වු ප්‍රසිද්ද වු (නමගිය) උත්තමයෝ යම් කිසිවකු නිසා කොතෙක් පීඩාවට පත් උනත් තරහා (නපුරුසිත්) ඇති කර නොගනිති. (එය හරියට) හැම දෙනා හොඳින් දන්නා (පරිදි) සුවඳ හොඳ සඳුන් කඳක් (ලී කැබැල්ලක්) කපන විටත්, තලන විටත් එක් විදියටම සුවඳ පැතිරෙන්නාක් වැනිය.

"ගුනවත් නැනවත් උත්තමයන් කොතෙක් පීඩා කරනු ලැබුවත් තරහ ගන්නේවත් සිත නපුරු කර ගන්නේවත් නැත. එය හරියට සඳුන් ලී කැබැල්ලක් කපන විටත් තලන විටත් සුවඳ පැතිරෙන්නාක් වැනිය." යන අදහස දිග්ගස්සා මේ කවිය ලියා ඇත.

'අමිත' යනු මිනිය නොහැකි හෙවත් අප්‍රමාන යන අදහස දීම සඳහා බාවිතා කරන වචනයකි. පසිදු - පසිඳු වෙනුවට මෙහි යොදා ඇති 'පබඳ' යන්නේ 'ප්‍රසිද්ද' යන තේරුම ඇති අන් තැනක් ගැන මා අසා නැත. තුන් වන අකුර 'ත' යන්නත් අන්තිම අකුර ඳ/ද යන්නත් එලිවැටක් කිරීම සඳහා පසිඳු වෙනුවට -පබඳ" යොදා ගැනීම බොලඳ කමකි; 'ප්‍රබන්ධ' යන සකු වචනය සිංහලයට බිඳෙන්නේ 'පබඳ' යනුවෙනි. මනා ලෙස බැඳි යන තේරුම එහි ඇත. විරිත එලිවැට රැකීම සඳහාත් නොගැලපෙන වචන පිරිද්දීමත්, සක්ක පද ගැන්වීමත් කරන බව රහසක් නොවේ. සුභාෂිතයේ එබඳු වචන බෙහෙවින් දක්නට ලැබේ.

වෙහෙස යනු මහන්සිය, විඩාව, පීඩාව, ගැරහීම යන තේරුම දෙන වචනයකි. සුහද යනු හොඳ හිතයි. දුහද යනු නපුරු - තරහ සිතයි. හද (වත) යනු -හෘද(ය) වස්තුව සිංහලයට බිඳෙන හැටියි. හිතත් හදවතත් අතර සබඳතාවක් ඇද්දැයි මම නොදනිමි. සුහිත - සුහිත සුමන - දුමන යන පද වියහරේ නැත." දිගත පතල සුවඳති" යන්නට සමහර උගතුන් -දිශාන්තයෙහි පැතුරුනා වු සුවඳ ඇති" යන තේරුම දී ඇතත් මා එහි දකින්නේ වෙන තේරුමකි. සඳුන් සුවඳවත් බව නොදන්නා කෙනෙක් නැත. එනිසා මා එහි දකින්නේ -දිගත පසිඳු" යන තේරුමයි. සඳුනෙහි දිගත පැතිරෙන සුවඳක් ඇතැයි යන්න සිනා කතාවකි. -සොඳ" යන්න වැඩියකි. දිගත පැතිරෙන සුවඳක් සඳුනෙහි වෙත් නම්, එය තැලීමෙන් අමුතු සුවඳක් ඇති වෙතැයි සිතිය නොහැකිය. කවියේ දී (පද්‍යයේදී) ඔබඳු දෙස් සැලකිල්ලට ගත යුතු නැතැයි කියති.

"මැරුව මුනි මහතා - බුදු බව ලැබෙයි නියතා
කර අනුවන සිතා - ඇරැම් නාලාගිරි මඳැතා"

මෙහි ඇති "මුනි මහතා" අනුයමින් අපි බුදු මහතා සඟ මහතා වැනි යෙදුම් නොකරමු. -නියතා බුදු බව ලැබෙයි සිතා .." යන්න වියරන නියරට පටහැනිය. -නියතා බුදු බව ලැබෙතියි / ලැබෙතැයි සිතා" නිවැරදි වියහරයි. -අනුවන සිතා කර" යන්නද තේරුම් ගත හැකි උවත් -අනුවන සිතුමක් සිතා - අනුවන සිතිවිලි ඇති කර ගෙන" යනු සාමාන්‍ය වියහරයි.

"මහසත් ගුනෙන් යුත් මහ ඔසු පඬි සඳ" යන තැන 'පඬි' පඬී වී ඇති විදියට මෙහි ද "නාලගිරි" යන්න 'නාලාගිරි' වී ඇත. මේ ගීය මෙයට ඇද ගත්තේ කවියේ දී හෙවත් පද්‍යයේ දී බොහෝ දෙනා අතින් වැරදි සිදුවන සැටි පෙන්වා දීමටයි.

ඇතකුට වෙඩි තැබීම තරම් හාවකුට වෙඩි තැබීම පහසු නැත.

වි. ක. ධර්මබන්ධු

# අපේ නොලැබීම

*අගස්ති රිසිවරයා*
*මහ සයුර බී පියා*
*සයුරු පත්ලෙහි වූ*
*මිනි පබා දුටු බව*
*කියා ඇත ඒ දුටුවෝ*

*අපේ ලක් බිමෙහි ද*
*පුලතිසි යන නමින්*
*එක් ම එක් රිස්සකු*
*විසූ බව කියතත්*
*ඔහු එබඳු සුරු විරු කම්*
*කල බවක් මා අසා නැත*

*දඹදිව් තලෙහි නම්*
*කෙල ලක් ගනන් රිස්සන්*
*මිනිස් වග වෙනුවෙන්*
*නොයෙක් මහ වැඩ මෙන් ම*
*අපූරු නිපැයුම් කල බවටත්*
*හොඳ හොඳ රස කතා ඇත.*
*ඒ නම් බොහොම ඉස්සර.*

*අද නම් දඹදිවේ*
*රිස්සන් සිටිද්දැයි*
*දන්නා කෙනෙක් නැත.*

*ඒ රිසිවර පරපුර*
*වඳ වී ගියේ කෙසේ දැයි*
*දන්නා කිසිවෙක් ද නැත.*

*අපේ නොලැබිල්ලට*
*ඒ සේ මත් නැත්නම්*
*අවාසනාවට*
*එහෙම වන්නට ඇත.*

*වැරදිලා වත්*
*අගතිසි රිස්සා වැනි*
*"මෝඩ" රිසිවරයකු*
*අද පහල වී සිටිත් නම්*
*දඹදිවේ සහ ලක්දිවේ*
*විතරක් නෙවේ මේ*
*ඕස්ට්රේලියාවේ පවා*
*ඇති වන*

*රුදුරු බියකරු ගංවතුර*
*බී පියා සංසිඳුවන්නටත්*
*සැඩ සුලං ලැව් ගිනි*
*පිඹ පියා දුරු කර*
*රටට සෙත යහපත*
*උදා කර ලන්නටත්*
*හැකි වීම නම්*
*සි - කු - රු - ය් -*
*ඒ - කාන්තයි.*

*වි.ක. ධර්මබන්ධු*


**'Nivasipura' Ekala, Ja-ela**
**House for sale**
three bedrooms, dining, pantry
bathroom & a servant's bathroom, fully tiled
located closer to Katunayaka Airport



Facilities include
supermarket
swimming pool
jogging track
play grounds
kiddie`s park
bus service
and 24hr security

**Price AUD 42,000**

**Contact**
Roshani
83519566, 0431403072
email rosh123@gmail.com

## ගුරුවරුන් අවශ්‍යයි

මෙල්බර්න් බටහිර ප්‍රදේශයේ සිංහල භාෂා පාසලක ඉගැන්වීම සඳහා ස්වේච්ඡා ගුරුවරුන් අවශ්‍ය වී තිබේ ඉගැන්වීමට උනන්දුවක් හා හැකියාවක් ඇති අය කරුණාකර 0425 855 621 දුරකතන අංකයට අමතන්න




නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සැම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම
සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න